සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර I විභාගය - 2021 ජනවාරි

## (103) ආර්ථික විද්‍යාව

(Economics)

2021-03-13
පස්වරු
[02.00 – 05.00]

පිටු ගණන : 06
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 40)

## 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.1 පහත සඳහන් ඒවා අතුරෙන්, ආර්ථික භාණ්ඩයක ලක්ෂණයක් වන්නේ කුමක් ද?

(1) ආර්ථික භාණ්ඩයක් නිපදවීමේදී ආවස්ථික පිරිවැයක් නොමැත.

(2) ආර්ථික භාණ්ඩයක් යනු නිෂ්පාදන ක්‍රියාවලියක ප්‍රතිඵලයකි.

(3) සැපයුමේ හිඟකමක් නොමැත.

(4) ආර්ථික භාණ්ඩයක්, ස්වභාවදහමේ දායාදයක් ලෙස සළකනු ලැබේ.

1.2 පහත සඳහන් ඒවා අතුරෙන්, ආර්ථික විද්‍යාවේ "හිඟකම" සම්බන්ධයෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න:

(1) එය අදාල වනුයේ ලෝකයේ දුප්පත් රටවලට පමණි.

(2) භාණ්ඩ හා සේවා නිෂ්පාදනයේදී සම්පත්වල විකල්ප භාවිතයන් පිළිබඳ එමගින් පැහැදිලි කරයි.

(3) එය, මිනිස් අවශ්‍යතා සහ වුවමනා සපුරාලීම සඳහා ඇති සම්පත්වල සීමිත බව වේ.

(4) එය, ආර්ථික ක්‍රියාකාරකම් සඳහා උපයෝජනය නොකළ සම්පත් භාවිතයේදී පැන නගියි.

**1.3** යම් තීරණයක් තෝරා ගැනීමේදී කැප කරනු ලබන ඊළඟ හොඳම විකල්පයේ වටිනාකම හඳුන්වනු ලබන්නේ:

(1) ආර්ථික පිරිවැය ලෙසයි. (2) සාමාන්‍ය පිරිවැය ලෙසයි.

(3) ආවස්ථික පිරිවැය ලෙසයි. (4) ආන්තික පිරිවැය ලෙසයි.

**1.4** පහත සඳහන් ඒවා අතුරෙන්, නිවැරදි ප්‍රකාශය වන්නේ කුමක් ද?

(1) භාණ්ඩයක් පරිභෝජනය කිරීමෙන් ලැබෙන තෘප්ති මට්ටම මැනිය නොහැකි බවට සංඛ්‍යා සූචක උපයෝගිතා න්‍යායෙන් (the theory of Cardinal Utility) උපකල්පනය කෙරේ.

(2) උපයෝගීතාවය මැනිය හැකි බවට ක්‍රම සූචක උපයෝගිතා න්‍යායෙන් (the theory of Ordinal Utility) උපකල්පනය කෙරේ.

(3) භාණ්ඩ හා සේවා පරිභෝජනය කිරීමෙන් ලැබෙන ආන්තික තෘප්තිය, මුළු උපයෝගීතාවය වේ.

(4) කිසියම් පුද්ගලයෙකු දෙන ලද කාල සීමාවක් තුළ අතිරේක භාණ්ඩ ඒකකයක් පරිභෝජනය කිරීමෙන් ලැබෙන අතිරේක තෘප්තිය, ආන්තික උපයෝගීතාවය වේ.

**1.5** පහත සඳහන් ඒවා අතුරෙන්, මිල ඉල්ලුම් නම්‍යතාවය තීරණය කරන සාධකයක් වන්නේ කුමක් ද?

(1) අදාල භාණ්ඩය අත්‍යාවශ්‍ය භාණ්ඩයක් ද, සුඛෝපභෝගී භාණ්ඩයක් ද යන වග.

(2) අදාල භාණ්ඩය සඳහා ඇති ආදේශක ගණන.

(3) අදාල භාණ්ඩය මත ආදායමෙන් වියදම් කරන ප්‍රතිශතය.

(4) ඉහත සඳහන් සියල්ලම.

**1.6** **A භාණ්ඩයට** අදාලව, පහත සඳහන් ඉල්ලුම් සහ සැපයුම් වක්‍ර ඔබ වෙත ලබාදී ඇත:




**A භාණ්ඩය** වෙළෙඳපොළේ විකිණිය හැකි උපරිම මිල රු.100/- කි. පාරිභෝගික අතිරික්තය වන්නේ:

(1) රු.2,500/- කි. (2) රු.5,000/- කි. (3) රු.1,250/- කි. (4) රු.1,000/- කි.

**1.7** පහත සඳහන් ඒවා අතුරෙන්, විද්‍යුත් මුදල් සඳහා උදාහරණයක් වන්නේ කුමක් ද?

(1) ඉතුරුම් තැන්පතු (Savings Deposits). (2) ණයපත් (Credit Cards).

(3) ස්ථාවර තැන්පතු (Fixed Deposits). (4) භාණ්ඩාගාර බිල්පත් (Treasury Bills).

1.8 ඉල්ලුම් නීතිය මගින් පැහැදිලි කරන්නේ:

(1) වෙළෙඳපොළක භාණ්ඩයක මිල සහ එම භාණ්ඩයේ ඇති ඉල්ලුම් ප්‍රමාණය අතර ඇති ප්‍රතිලෝම සම්බන්ධතාවය වේ.

(2) ආදායමේ වෙනස හේතුකොටගෙන ඉල්ලුමේ සිදුවන වෙනස වේ.

(3) භාණ්ඩයක් සඳහා ඇති ඉල්ලුමේ වෙනස හේතුවෙන් අමුද්‍රව්‍ය සඳහා ඇති ඉල්ලුමේ සිදුවන වෙනස වේ.

(4) වෙනත් භාණ්ඩයක මිල වෙනස්වීමේ ප්‍රතිඵලයක් ලෙස තවත් භාණ්ඩයක ඉල්ලුමේ සිදුවන වෙනස වේ.

1.9 පහත සඳහන් ඒවා අතුරෙන්, ගෙවුම් ශේෂ ලේඛනයේ මූල්‍ය ගිණුමේ ඇතුළත් වන්නේ කුමක් ද?

(1) සෘජු විදේශ ආයෝජන. (2) භාණ්ඩ අපනයන.

(3) රාජ්‍ය ප්‍රදාන. (4) භාණ්ඩ ආනයන.

1.10 2019 වර්ෂය සඳහා වන ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවට අනුව, 2019 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය වූයේ:

(1) 6%. (2) 2.3%. (3) 3.2%. (4) 4.8%.

*අංක 1.11 සහ 1.12 ප්‍රශ්නවල හිස්තැන් පිරවීම සඳහා වරහන් තුල දී ඇති උත්තර දෙක අතුරින් නිවැරදි උත්තරය තෝරාගන්න. තෝරාගත් උත්තරය ප්‍රශ්න අංකය සමඟ, උත්තර පොතේ ලියන්න.*

1.11 ආයතනයක ආන්තික අයභාරය එහි …………….. *(ආන්තික පිරිවැයට / සාමාන්‍ය පිරිවැයට)* සමාන වන අවස්ථාවේදී එහි ලාභය උපරිම වේ.

1.12 පාරිභෝගික ආදායම වැඩිවන විට, ඉල්ලුම් වක්‍රය …………….. *(වමට / දකුණට)* විතැන් වේ.

*අංක 1.13 සිට 1.15 දක්වා ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍යදැයි** දක්වන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.13 ණය සඳහා උපරිම කල් පිරීමේ කාල සීමාවක් නියම කිරීම, ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්තියේ ඇති ප්‍රමාණාත්මක පාලන උපකරණයකි.

1.14 ආර්ථික ක්ෂය, වක්‍ර පිරිවැය සඳහා උදාහරණයකි.

1.15 **A** සහ **B** භාණ්ඩ අතර හරස් මිල ඉල්ලුම් නම්‍යතාවය සෘණ වේ නම්, එම භාණ්ඩ ආදේශක භාණ්ඩ ලෙස සලකනු ලැබේ.

*අංක 1.16 සිට 1.20 දක්වා ඇති ප්‍රශ්නවලට උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.16 සැපයුම් වක්‍රය වමට විතැන්වීමට බලපාන සාධක දෙකක්(02) සඳහන් කරන්න.

1.17 "ඉල්ලුම් ප්‍රමාණය වෙනස්වීම" යන පදය කෙටියෙන් පැහැදිලි කරන්න.

1.18 වැඩිවන පරිමාණානුකූල ඵල (increasing returns to scale) ඇති වීම කෙරෙහි බලපාන සාධක දෙකක්(02) සඳහන් කරන්න.

1.19 ආන්තික ආදායම [Marginal Revenue (MR)], යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

1.20 වෙළෙඳපොළට රජය මැදිහත් වන ආකාර දෙකක්(02) සඳහන් කරන්න.

(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 40)

### 02 වන ප්‍රශ්නය

(a) ආර්ථිකයක ප්‍රධාන ආර්ථික සම්පත් (නිෂ්පාදන සාධක) හතර(04) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(b) වෙළෙඳපොළ ආර්ථික ක්‍රමයක ලක්ෂණ (characteristics) හතරක්(04) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 04)

(c) (i) ආර්ථික විද්‍යාවේ "තේරීම" (choice) යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 02)

(ii) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක උපකල්පන (assumptions) දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

### 03 වන ප්‍රශ්නය

(a) **X නිෂ්පාදිතයට** අදාලව ඉල්ලුම් සමීකරණය (Qd) සහ සැපයුම් සමීකරණය (Qs) පහත පරිදි වේ:

$$Qd = 3,600 - 7P$$

$$Qs = -200 + P$$

ඉහත සඳහන් තොරතුරු භාවිත කරමින්,

සමතුලිත මිල සහ ප්‍රමාණය **ගණනය කරන්න**. (ලකුණු 04)

(b) නිෂ්පාදන ක්‍රියාවලියක කෙටි කාලය (short run) සහ දිගු කාලය (long run) අතර ඇති වෙනස **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(c) ඒකාධිකාරී තරඟකාරී වෙළෙඳපොළක (monopolistic competitive market) ලක්ෂණ දෙකක්(02) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

### 04 වන ප්‍රශ්නය

(a) වාණිජ බැංකුවක කාර්යයන් (functions) හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(b) වාණිජ බැංකුවලට අදාලව ලාභදායකත්වය (profitability) සහ ද්‍රවශීලතාවය (liquidity) අතර සම්බන්ධතාවය **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(c) උද්ධමනය ඇතිවීමට හේතු දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

(a) අන්තර්ජාතික වෙළඳාමේ අවාසි (disadvantages) දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(b) ආරක්ෂණවාදයේ (protectionism) වාසි දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(c) ඇමරිකානු ඩොලරයට ($) සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය (devaluing) වීමෙන් ශ්‍රී ලංකා ආර්ථිකයට ඇති වන ප්‍රතිවිපාක (consequences) තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 20)

## 06 වන ප්‍රශ්නය

(A) වසරක කාලයක් සඳහා ආර්ථිකයක ජාතික ගිණුම්වලට අදාල පහත සඳහන් උපකල්පිත දත්ත ඔබ වෙත සපයා ඇත:

| | **රු. මිලියන** |
|---|---|
| පෞද්ගලික පරිභෝජන වියදම් | 600 |
| රජයේ පරිභෝජන වියදම් | 500 |
| දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | 400 |
| තොග වෙනස්වීම් | 200 |
| අපනයන | 400 |
| ආනයන | 250 |
| විදේශ ශුද්ධ සාධක ආදායම<br>(විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම) | -100 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

වියදම් ප්‍රවේශය (expenditure approach) භාවිත කරමින්, පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(a) වෙළෙඳපොළ මිලට දළ දේශීය වියදම [Gross Domestic Expenditure (GDE)]. (ලකුණු 05)

(b) වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය [Gross Domestic Product (GDP)]. (ලකුණු 03)

(c) වෙළෙඳපොළ මිලට දළ ජාතික ආදායම [Gross National Income (GNI)]. (ලකුණු 02)

(B) (a) රජයේ පිස්කල් ප්‍රතිපත්තිය (Fiscal Policy) සහ මූල්‍ය ප්‍රතිපත්තිය (Monetary Policy) අතර වෙනස **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(b) අයවැය හිඟය (budget deficit) යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 02)

(C) (a) වෙළෙඳපොළ ආර්ථිකයක් තුළ සම්පත් බෙදී යාමේ අකාර්යක්ෂමතාවයන් වැළැක්වීම (inefficiencies of resource allocation) සඳහා රජය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග (measures) දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(b) රජයේ අසමත්වීම (failure of the government) කෙරෙහි බලපාන හේතු දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | අඳින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | හඳුනාගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | අර්ථකතනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | පැහැදිලි කරන්න | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | සසඳන්න | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | පිළියෙල කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනඟා ප්‍රශ්න විසඳීම. | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |